**පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය

හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූලාා ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.486,450 ක් වැයකර මිලදී ගත් ජලයේ ගිල්වන අශ්ව බල 4 මෝටරය හා පොම්පයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ස්ථාවර තැන්පත් පොළිය මත බැංකුව විසින් රඳවාගත් බදු මුදල ගණන් බලා ගිණුම්වල අනාවරණය කර නොතිබුණි. මේ නිසා වර්ෂයේ ආදායම හා වියදම අඩුවෙන් නිරූපණය විය. | ඉදිරියේදී නිවැරදි කරන බව | - එම - |
| (ඇ) | පරිත්‍යාග ලෙස ලැබුණ වටිනාකම රු.507,330 ක පහත සඳහන් භාණ්ඩ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | - එම - |

### 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම්

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| හිඟහිටි කඩකුලී | 51,753 | 7,800 | 43,953 | ඉදිරියේදී ගිණුම් පොත්පත් නිවැරදිව පවත්වාගෙන යන බව | ලේඛන නිසි පරිදි පවත්වා ගත යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි | 136,154,756 | අයිතිය තහවුරු වන ලියවිලි, මිනින්දෝරු සැලසුම් | **ඉඩම් හා ගොඩනැගිලි -** නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය | ගිණුම් විෂයයන්ට අදාළ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති බව | |
| (ආ) | ජල ගබඩා | 1,524,081 | තොග ලේඛන, ලැයිස්තුව | ශේෂ | නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන බව | - එම - |
| (ඇ) | ආදායම් ණය ගැතියෝ | 11,815,086 | කේවල ලැයිස්තුව, විශ්ලේෂණ | ශේෂ කාල | නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන බව | - එම - |
| (ඈ) | හිඟ හිටි ජල බිල්පත් | 743,937 | කේවල ලැයිස්තුව | ශේෂ | නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන බව | - එම - |
| (ඉ) | වියදම් ණය හිමියෝ | 10,454,717 | කේවල ලැයිස්තුව, විශ්ලේෂණ | ශේෂ කාල | නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන බව | - එම - |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 වගන්තිය | සභාව සතු ඉදිකිරීම් කරන ලද මාර්ග ඉන්වෙන්ට්‍රිගත නොකර තිබුණ අතර එම මාර්ග සියල්ල ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මේ සියල්ල සම්පූර්ණ කර ගැසට් කිරීමට කටයුතු කරන බව | ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 119 වගන්තිය | සතිපොළ නියාමනය සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පනවන බව | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | 126 වගන්තිය | සභාව තුළ නව ආදායම් උත්පාදන කළ හැකි පරිදි අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ඉදිරියේ දී නිශ්චිත සැළසුම් සහිතව අතුරු ව්‍යවස්ථා පැනවීමටත් තවත් නව ආදායම් උත්පාදනය කළ හැකි අතුරු ව්‍යවස්ථා | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | | පනවාදීමට කටයුතු කරන බව | |
| | (iv) 134 වගන්තිය | සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන වරිපනම් හා බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු වාර්තා කැඳවා ඉදිරියේදී කඩිනමින් වරිපනම් බදු පනවන බව | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුය. |
| | (v) 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.955,241 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතී මාලාව | | | |
| | (i) 193 වැනි රීතිය | අයවැය හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්තය හා ඌණතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයන් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2024 අවසන් ගිණුම්වලදී නිවැරදි කරන බව | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතී අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 218 වැනි රීතිය | පිරිවැය රු.136,154,757 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීතී අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2006 අංක 12 දරණ මුද්දර බදු විශේෂ විධිවිධාන පනත | වැටුපෙන් අයකරනු ලබන මුද්දර ගාස්තුව ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවිය යුතු වුවද 2019 වර්ෂයේ සිට | කඩිනමින් නිවැරදි කරන බව | මුද්දර බදු විශේෂ විධිවිධාන පනත අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2023 දෙසැම්බර් මාසය දක්වා වැටුපෙන් අඩුකර තිබූ රු.33,425 ක් වටිනා මුද්දර ගාස්තු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 04/1994 හා 1994 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛය | සෑම මාණ්ඩලික නිලධාරියෙකු විසින් වාර්ෂිකව තම වත්කම් හා බැරකම් ප්‍රකාශ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.1,946,727 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.713,438 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කුලී | 700 | 647 | 640 | 51 | 600 | 566 | 566 | 44 |
| බලපත්‍ර ගාස්තු | 500 | 746 | 740 | 167 | 675 | 549 | 549 | 161 |
| වෙනත් ආදායම් | 12,000 | 15,127 | 14,383 | 1,307 | 10,000 | 8,463 | 8,028 | 563 |
| **එකතුව** | **13,200** | **16,520** | **15,763** | **1,525** | **11,275** | **9,578** | **9,143** | **768** |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා කාර්යයන් අතර ප්‍රධාන කාර්යයක් ලෙසට බල ප්‍රදේශයේ සිදු කරන ඉඩම් සංවර්ධන කටයුතු නියාමනය කිරීම සිදු කළ යුතු වුවද 2020 හා 2021 වර්ෂ වෙනුවෙන් සංවර්ධන බලපත්‍ර එක බැගින්ද 2022 වර්ෂය සඳහා කිසිවක් නිකුත් කර නොතිබුණු අතර 2023 වර්ෂය වෙනුවෙන්ද එක් සංවර්ධන බලපත්‍රයක් පමණක් නිකුත් කර තිබුණි. එසේ වුවද බල ප්‍රදේශයේ කිසිදු අනවසර ඉදිකිරීමක් වාර්තා නොවී තිබීම නිසා මෙම කාර්යයන් මනාව නියාමනය වී නොතිබුණු බව තහවුරු විය. | ඉදිරියේදී නිවැරදි කරන බව | ගෙඩනැගිලි ඉදිකිරීම මනාව නියාමනය කළ යුතුය. |
| (ආ) | සභාව සතුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් නිසි සැලසුමක් නොතිබුණි. කෙසේ වෙතත් නගරයේ කසල වෙන්කර ලබා ගැනීම සඳහා 2022 වර්ෂයේදී රු.959,820 ක් වැයකර කසල බඳුන් මිලදී ගෙන තිබුණු නමුත් වෙන්කළ කසල ලබා ගැනීමේදී ට්‍රැක්ටරයේ ටේලරය එසේ බෙදා නොතිබීම නිසා වෙන්කළ කසල නැවත මිශ්‍ර වන බැවින් ඒ සඳහා යොදා තිබුණු උත්සාහය අසාර්ථක වී තිබුණි. | අවශ්‍යතාවය අනුව කටයුතු කරන බව | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත්ව සිදු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු ලංකා බැංකු ජංගම ගිණුමේ 2023 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා සෑම මසක් අවසානයට විශාල මුදලක් රඳවාගෙන තිබුණි. මෙය මූල්‍ය කළමනාකරණ අකාර්යක්ෂමතාවයක් ලෙස නිරීක්ෂණය විය. මෙම මුදල ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණේ නම් පවතින පොළී අනුපාතයට අනුව රු.617,490 ක ආදායමක් උපයාගත හැකි වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභාව යටතේ රුපියල් 1505763.84 ක ස්ථාවර තැන්පතුවත් පවත්වාගෙන යන අතර මෙම 6635422 යන ලංකා බැංකු ජංගම ගිණුමේ පවතින ශේෂය හදිසි මිලදී ගැනීම් (ජල පොම්ප ආදී) සඳහා අරමුණින් පවත්වාගෙන යන බවත් කාරුණිකව දැනුවත් කර සිටිමි. | ආදායම් පරිපාලනය, මූල්‍ය කළමනාකරණය මානව සිදු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.388,148 ක් වූ අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. | වසර ගණනාවක සිට අත්තිකාරම් ගිණුමේ ශේෂයක්,කොන්ත්‍රාත් තැන්පතු කිරීමේ ශේෂයක් හා විවිධ තැන්පතු ගිණුමේ ශේෂයක් පවතින අතර මේවා ක්‍රමවත්ව විසඳීමට කළමනාකරණ කමිටු රැස්වීමේදී හා විගණන කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කර ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | අත්තිකාරම් මනාව නිරවුල් කළ යුතුය. |
| (ආ) | දිගින් දිගටම පවතින රු.3,256,708 ක් වූ කොන්ත්‍රාත් තැන්පත් නිදහස් කිරීමට හෝ සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව | කොන්ත්‍රාත් පාලනය මනාව සිදු කළ යුතුය. |
| (ඇ) | වටිනාකම රු.1,745,236 ක් වූ විවිධ තැන්පත් හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | තැන්පත් ගිණුම් මනාව පවත්වා ගත යුතුය. |

### 3.4 නිශ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 02/2017 දරන 2012 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට අයත් නොවන පිරිවැය රු.18,009,050 ක් වූ වාහන 05 ක් නිසි පරිදි පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | පවරාගැනීමේ කටයුතු කඩිනමින් සිදු කරන බව | වත්කම් කළමනාකරණය මනාව සිදු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සභාවේ අනුමත සේවක මණ්ඩලය හා තථ්‍ය සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 11 ක පුරප්පාඩු 18 ක් පැවතුණි. | මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරන ලෙසට අදාළ අංශ දැනුවත් කර ඇති බව | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ඇප තැබිය යුතු නිලධාරීන්/ සේවකයින් නැගෙනහිර පළාත් මූල්‍ය චක්‍රලේඛ PT/03/2021 පරිදි ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ විධි විධාන හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර තිබුණ අතර ප්‍රවර්ථන වර්ෂයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන් හඳුන්වා දී නොතිබුණි. එසේම අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කොට ජාතික විගණන කාර්යාලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | අභ්‍යන්තර විගණන විධිමත් කළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 13.97 ක සිට සියයට 818.33 ක් දක්වාද, වියදම් විෂයන් 05 ක සියයට 11.66 ක සිට සියයට 78.92 ක් දක්වාද විචලනයක් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය. |

## 4.3 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 අංක 47 දරන ජාතික පරිසර පනතට සිදු කළ සංශෝධන ප්‍රකාරව කටයුතු නොකිරීමත් වර්ගීකරණය කර එකතු කරනු ලබන කසල නැවත මිශ්‍ර කිරීමත්, ඒවා නිදහසේ පරිසරයට මුදා හැරීමත් නිසා ගංවතුර අවස්ථාවලදී මෙන්ම දැඩි වර්ෂා කාලවලදී අක්‍රමවත්ව බැහැර කරන ලද කසල ජල මාර්ගවලට මුසු වීමෙන් ජලජ ජීවීන්ට මෙන්ම වන සතුන්ට හා මානව වර්ගයාට පාරිසරික ගැටළුවලට මුහුණ දීමට සිදු වී තිබුණි. | පරිසරයට සිදු වන හානිය අවම වන පරිදි කටයුතු කරන බව | කසල කළමනාකරණය මනාව සිදු කළ යුතුය. |